# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 7.
**Tel: 11 4062180-190, 011 2565304, Fax: 011 4714460, 0114503001**.
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cmev.org


**ජනාධිපතිවරණය 2015,**

**මාධ්‍ය නිවේදන 12**

**2015 ජනවාරි 05 වන දින පෙ.ව.2.00ට.**

ජනවාරි 4 දින ප.ව.8.30ට පමණ ත්‍රිකුණාමලයේ දී ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය සුසන්ත පුංචිනිළමේ ඇමතිවරයාගේ ආධාරකරුවන් විසින් මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දෙදෙනෙකුට පහර දීමේ සිද්ධිය සම්බන්ධව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය සිය දැඩි අවධානය යොමු කර සිටී. ත්‍රිකුණාමලය මට්ටකාලි හංදියේ පිහිටි එක්සත් ජනතා නිදහස් සන්ධාන කාර්යාලය ඉදිරිපිට දී මෙම පහර දීම සිදු වී ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක ප්‍රදේශයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා වන සජිත් වෙල්ගම මහතාගෙන් විමසූ විට ඔහු මැ.ප්‍ර.නි.ම.ට ප්‍රකාශ කර සිටියේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට අයත් අවසර නොලත් පක්ෂ කාර්යාලයක් වසා දැමීමෙන් පසු මහදිවුල්වැව බලා එමින් සිටිය දී මෙම සිදුවීමට මුහුණ දීමට සිදු වූ බවයි. මොරවැව බෞද්ධ විහාරයේ පිහිටුවා තිබූ මහින්ද රාජපක්ෂ මහතාගේ පෝස්ටර් සහ ප්‍රදර්ශන පුවරු ඉවත් කිරීම සඳහා ඔහු සිය සහෝදර නිලධාරීන්ට නියෝග කර ඇත. ඔහු මට්ටකාලී හි පිහිටි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කාර්යාලය දෙසට පැමිණෙන විට එම කාර්යාලය ඉදිරිපිට මහින්ද රාජපක්ෂ මහතාට වාසිදායක වන අන්දමේ චිත්‍රපටියක් ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කරමින් සිට ඇත. එය දැකීමෙන් පසු එම චිත්‍රපටිය කාර්යාලයෙන් පිටත ප්‍රදර්ශනය නොකරන ලෙසත් කාර්යාලය තුළ පමණක් ප්‍රදර්ශනය කරන ලෙසත් ඔහු ඉල්ලා ඇත. එම අවස්ථාවේ දී නියෝජ්‍ය අමාත්‍ය පුංචිනිළමේ මහතාගේ ආධාරකරුවන් සජිත් වෙල්ගමෙ මහතා සමඟ පැමිණි නිලධාරීන් දෙදෙනාට පහර දී ඇති අතර එම පහර දිම සිදු වන විට විදුලිය විසන්ධි කිරීමක් ද සිදු කර ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කොමසාරිස්වරයා සම්බන්ධ කරගත්ත ද විමර්ෂණ කටයුතු සිදුවෙමින් පැවති නිසා තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. නමුත් එම සිද්ධිය සත්‍යයක් බවට තහවරු කරන ලදී. මැ.ප්‍ර.නි.ම.ට සමාන ප්‍රතිචාර ත්‍රිකුණාමලය පොලිස් ස්ථානයෙන් ද ලැබුණි.

මේ අතරේ සිද්ධියෙන් සුළු මොහොතකට පසු පොලිස් ස්ථානයට පැමිණ සිටි මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක ප්‍රකාශ කර සිටියේ සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා නියෝජ්‍ය අමාත්‍ය පුංචිනිළමේ මහතා පොලිසියට පැමිණීමත් සමග නිදහස් කළ බවයි.

තම රාජකාරියේ නිරත රජයේ නිලධාරීන්ට පහර දී නියමිත ක්‍රමවේදයන්ගෙන් බැහැරව නිදහස් විය හැකිය යන දේශපාලන ආධාකරුවන්ගේ හැඟීම මැ.ප්‍ර.නි.ම. දැඩි ලෙස අවධාරණය කර සිටී. පොලීසිය

සහ සියලුම දේශපාලන බලධාරීන්ගෙන් මැ.ප්‍ර.නි.ම. ඉල්ලා සිටිනුයේ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ඔවුන්ගේ බල සීමාවන් තුළ සියලුම අවශ්‍ය පියවර ගන්නා ලෙසත් සහ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට වරදකරුවන් වන පුද්ගලයන් ඒ සඳහා වගවීමට ලක් කරන ලෙසත් ය. මැතිවරණය සඳහා ලබා දී ඇති සීමාවන් තුළ හිඳිමින් සිය අධාරකරුවන් මැතිවරණ ක්‍රියාවලියේ නිරත වන බවට වගබලා ගන්නා මෙන් මැ.ප්‍ර.නි.ම. සියළුම දේශපාන අපේක්ෂකයන්ගෙන් අයැද සිටියි

මැ.ප්‍ර.නි.ම. වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම. සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.



ආචාර්ය පී. සරවනමුත්තු
සම කැඳවුම්කරු